# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2009

### (2010 මැයි / ජූනි)

### සමාජීය විද්‍යා පීඨය

### ජාත්‍යන්තර අධ්‍යයනය - INTS -E2015

### ජාත්‍යන්තර ආර්ථික කටයුතු

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න**

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි | කාලය : පැය 03 යි

---

01. "ජාත්‍යන්තර වෙළඳාමේ පදනම වන්නේ සාපේක්ෂ වාසි න්‍යායයි" නමුත් එහි තවදුරටත් ඉදිරියට යාමක් ලෙස හෙක්ෂ්චර් - ඕලින් (Heckscher Ohlin) න්‍යාය හැඳින්විය හැක." විමසන්න.

02. ජාත්‍යන්තර වෙළඳාමතුළ කලාපීයකරණය තුලින් බලාපොරොත්තු වූ අභිමතාර්ථයන් වර්තමාන ප්‍රයෝගිකත්වයේ දී ඉටුවේදැයි උදාහරණ දෙමින් විග්‍රහ කරන්න.

03. "විදේශ ණය සහ ආධාර මත ක්‍රියාකිරීම තුළ සංවර්ධනය වෙමින් පවතින රටවල් 'ණය උගුලක' හිරවී සිටිති." මෙම ප්‍රකාශය විමසන්න.

04. '' ජාත්‍යන්තර වෙළඳාම තුළ සංවර්ධනය වෙමින් පවතින රටවල ඇතිවන අවාසිය මඟහරවා ගැනීම සඳහා තීරු බදු ප්‍රතිපත්තිය යොදාගනී." තීරු බදුවල විවිධ අරමුණු සහ ප්‍රතිවිපාකයන් තුළින් ඉහත තර්කය පැහැදිලි කරන්න.

05. ලෝක වෙළඳාම තුළ අද විශාල කොටසකට හිමිකම් කියනුයේ බහු ජාතික සමායතනයන්ය. බහු ජාතික සමායතනයන්ගේ ක්‍රියාකාරීත්වය සංවර්ධනය වෙමින් පවතින රටවල් විෂයෙහි නව යටත් විජිතකරණ ලක්ෂණ පෙන්නුම් කරයි. විමසන්න.

06. "එක් රටක ඇතිවන ආර්ථික අර්බුදයක් ලෝකයේ අනෙකුත් රටවලට බලපෑම් කරනුයේ ජාත්‍යන්තර වෙළඳාම තුළ ඇති වූ ගෝලීයකරණය හේතුවෙනි." මේ අනුව 2007 ඇමරිකා එක්සත් ජනපද ආර්ථික අර්බුදය ලෝකයේ අනෙක් රටවල් කෙරෙහි ඇතිකරන ලද බලපෑම් පැහැදිලි කරන්න.

07. සංවර්ධනය වෙමින් පවත්නා රටවල් සම්බන්ධයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) දෙබිඩි පිළිවෙතක් අනුගමනය කරන බවට එල්ල වී ඇති චෝදනා පිළිබඳව විමසීමක් කරන්න.

08. ඕනෑම මාතෘකා <u>හතරකට (04)</u> සටහන් ලියන්න.

    i. ජාත්‍යන්තර ප්‍රවාහනය සහ වෙළඳාම
    ii. නිරපේක්ෂවාසී සහ සාපේක්ෂවාසී
    iii. ලෝක වෙළඳ සංවිධානය (WTO)
    iv. යුරෝපානු සංගමය ( Europian Union)
    v. තිරසාර සංවර්ධනය
    vi. ඍජු විදේශ ආයෝජන (FDI)

****************************